# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.01 පැය 1330 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/369/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මාතලේ අරුල්මිගු ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ වාර්ෂික තේරු උත්සවය වෙනුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම - මාතලේ පොලිස් වසම.**

මාතලේ නගරයේ පිහිටි අරුල්මිගු ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවාස්ථානයේ වාර්ෂික තේරු උත්සවය 2026.03.02 දින උදෑසන 0600 ට ආරම්භ කර තේරු රථ 05 ක් 2026.03.03 වන දින පස්වරු 06.00 දක්වා මාතලේ නගරයේ වීථි සංචාරය කිරීමට නියමිතය.

මෙම තේරු උත්සවය නැරඹීමට සහ ආශිර්වාද ලබා ගැනීම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් බැතිමතුන් හා විදෙස් සංචාරකයින්ගේ පැමිණීම අපේක්ෂා කරනු ලබයි. මෙම උත්සවයට සමගාමීව මාතලේ නගරයේ විනෝද සැණකෙළි භූමි කිහිපයක් ද ක්‍රියාත්මක වන බැවින් මෙම කාලය තුල නගරයේ විශාල රථ වාහන තදබදයක් ඇති වීමට ඉඩ ඇත.

එබැවින් මෙම තේරු උත්සවය පැවැත්වෙන කාලසීමාව තුල දඹුල්ල සිට මහනුවර දෙසට හා මහනුවර දෙස සිට දඹුල්ල දෙසට මාතලේ නගරය හරහා A009 මාර්ගයේ ගමන් කරන වාහන රියදුරන්ට හා මහජනතාවට පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**මහනුවර දෙස සිට මාතලේ නගරය හරහා දඹුල්ල දෙසට ගමන් ගන්නා වාහන රියදුරන්ට පහත විකල්ප මාර්ග භාවිතා කල හැක.**

- ❖ කුඹියන්ගොඩ මාර්ගයෙන් පැමිණ කුඹියන්ගොඩ පාලම අසලින් වමට ඇති හුලංගමුව මාර්ගය, ඔස්සේ මාතලේ නගරයේ රජ වීදියට පිවිස වමට හැරී දඹුල්ල දෙසට ගමන් කල හැක.

**දඹුල්ල දෙස සිට මාතලේ හරහා මහනුවර දෙසට ගමන් ගන්නා වාහන රියදුරන් භාවිතා කල යුතු විකල්ප මාර්ග.**

- ❖ තොටගමුව හන්දියෙන් වමට ඇති ඉඹුලන්දන්ඩ මාර්ගය ඔස්සේ ගමන් කර කනන්ගමුව හන්දියෙන් දකුණට ඇති පාරාවත්ත මාර්ගයේ කලුදෑවල දක්වා ගමන් කර වමට ඇති රත්තොට මාර්ගයේ වේරගම දක්වා ගමන් කර දකුණට හැරී කිවුල හරහා මාතලේ ගොංගාවෙල මාර්ගයට පැමිණ එම මාර්ගයේ වමට හැරී ගමන්කර මාතලේ / මහනුවර මාර්ගයට පිවිස මහනුවර දෙසට ගමන් කල හැක.

- 2025.03.02 වන දින තේරු රථ මාතලේ නගර මධ්‍යයේ ඇති ප්‍රධාන වීදිය ඔස්සේ ගමන් කරන අවස්ථාවේ දී මාතලේ නගරයේ රජ වීදිය ඔස්සේ දඹුල්ල හා මහනුවර දෙදිශාවටම රථ වාහන ගමනා ගමනය සිදු කල හැක.
- 2025.03.03 වන දින තේරු රථ රජවීදිය ඔස්සේ ගමන් කරන අවස්ථාවේ දී ප්‍රධාන වීදිය ඔස්සේ දඹුල්ල හා මහනුවර දෙදිශාවටම රථ වාහන ගමනා ගමනය සිදු කිරීමට සැළසුම් කර ඇත.

ඉහත නිවේදනය සම්බන්ධව රියැදුරන් සහ මහජනතාවගේ දැනගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මගින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.